**හබරාදූව ප්‍රාදේශීය සභාව**
**ගාල්ල දිස්ත්‍රික්කය**
**------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**
**-----------------**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
---------------------------------

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 30 දින ද, විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2019 ජුනි 13 දින ද සභාපතිවරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**
-------------------------------

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට හබරාදූව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**
**---------------------------------------------**

**(අ) ගිණුම්කරණ අඩුපාඩු**
-----------------------

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂය අවසානයට ඉඩම් හා ගොඩනැගිලි ගිණුමේ ශේෂය රු.1,661,158 කින් වැඩියෙන් දැක්වුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. | 2019 වර්ෂයේ ගිණුම් සැකසීමේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ii) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සේවක ඇප තැන්පත් හා සේවක ඇප තැන්පත් ආයෝජන රු.142,335 ක් ගිණුම්ගත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. | 2019 වර්ෂයේ ගිණුම් සැකසීමේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (iii) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟහිටි කුලී ආදායම රු.179,400 කින් අඩුවෙන් දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. | 2019 වර්ෂයේ ගිණුම් සැකසීමේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (iv) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පළාත් පාලන විශ්‍රාම වැටුප් අරමුදලට ගෙවිය යුතු රු.5,471,848 ක් සඳහා ණයහිමි ප්‍රතිපාදන සලසා නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. | 2019 වර්ෂයේ ගිණුම් සැකසීමේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**(ආ) නොසැසඳුනු ගිණුම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් විෂයයන් 09 කට අදාළ ශේෂයන් සහ ඒවාට අදාළ උපයෝගී ලේඛනවල දැක්වෙන ශේෂයන් අතර රු.10,594,070 ක වෙනසක් විය. | අදාළ ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතු වේ. | පවතින අසමානතාවයන් ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**(ඇ) අවිනිශ්චිත ගිණුම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2008 වර්ෂයේ සිට ඉදිරියට ගෙනෙමින් පවතින රු.601,430 ක් වූ අවිනිශ්චිත ගිණුමේ හර ශේෂය හඳුනාගෙන ගිණුම් නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂයේදී ත් කටයුතු කර නොතිබුණි. | අවිනිශ්චිත ගිණුමට බලපෑ හේතු හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වේ. | ඉදිරි වර්ෂයේ නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**(ඇ) ලැබිය යුතු ගිණුම් හා ගෙවිය යුතු ගිණුම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (i) **ලැබිය යුතු ගිණුම්** | | |
| වර්ෂ 2000 සිට 2011 දක්වා කාලයක සිට මූල්‍ය ප්‍රකාශනවල නොවෙනස්ව ඉදිරියට ගෙනෙමින් පවතින එකතුව රු.1,773,820 ක් වූ ලැබිය යුතු ගිණුම් ශේෂ 05 ක් අයකර ගැනීමට සමාලෝචිත වර්ෂයේදී ත් කටයුතු කර නොතිබුණි. | ලැබිය යුතු ගිණුම් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | ඉදිරියේ දී අයකර ගනිමි. |
| (ii) **ගෙවිය යුතු ගිණුම්** | | |
| 2011 වර්ෂයේ සිට මූල්‍ය ප්‍රකාශනවල නොවෙනස්ව ඉදිරියට ගෙනෙමින් පවතින එකතුව රු.8,823,727 ක් වූ ගෙවිය යුතු | ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වේ. | ඉදිරි වර්ෂයේ දී නිවැරදි කර ගනිමි. |

ගිණුම් ශේෂ 03 ක් නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂයේත් කටයුතු කර නොතිබුණි.

(ඉ) **විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම**

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
| --- | --- | --- |
| අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.122,982,754 ක් වූ ගිණුම් විෂයයන් 14 ක් සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළයුතු වේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**1.4** **අනුකූල නොවීම්**

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

| | **නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණයනාදියට යොමුව** | **වටිනාකම** | **අනුකූල නොවීම** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
| --- | --- | --- | --- | --- | --- |
| (අ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන ) රීති 217 | - | සභාව සතු සියළුම ඉඩම් හා ගොඩනැගිලි පිළිබඳ විස්තර ඇතුළත් කර පී.එස්.46 දරන ආකෘතිය ප්‍රකාර ලේඛනයක් පවත්වා නොතිබුණි. | රීති ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | ඉදිරියේ දී රීති ප්‍රකාරව කටයුතු කර නිවැරදි කරමි. |
| (ආ) | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි** | | | | |
| | (i) මුදල් රෙගුලාසි 261(3) | 304,550 | 2018 දෙසැම්බර් 01 දිනට මුදල් පොත අනුව බැංකු අයිරාවක් ඇති වී තිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | ඉදිරියේ දී මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කරමි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | (ii) මුදල් රෙගුලාසි 396(ඇ) | 29,424 | පොදු ගිණුමෙන් නිකුත් කරන ලද නමුත් ගෙවීම සඳහා ඉදිරිපත් කල වලංගු කාලය ඉක්මවා තිබූ චෙක්පත් 14 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | ඉදිරියේ දී මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කරමි. |
| | (iii) මුදල් රෙගුලාසි 571(1)(2) | 106,536,622 | වසර 02 ක කාලයක් ඉක්මවා තිබුණ තැන්පත් ශේෂ 72 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | ඉදිරියේ දී මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කරමි. |
| (ඇ) | 2015 ජූලි 10 දිනැති අංක 2/2015 දරන භාණ්ඩාගාර ලේකම්ගේ හා මුදල් අමාත්‍යාංශ ලේකම්ගේ චක්‍රලේඛය | - | සභාව සතු අබලි වාහන 07ක් චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. | නීති ප්‍රකාරව කටයුතු කළ යුතු වේ | ඉදිරියේ දී නීති ප්‍රකාරව කටයුතු කරමි. |

**2 මූල්‍ය සමාලෝචනය**

---------------------

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

---------------

විගණනයට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන ආදායම ඉක්ම වූ වියදම රු.15,038,060 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන ආදායම ඉක්ම වූ වියදම රු.223,262 ක් විය.

**2.2 මූල්‍ය පාලනය**

----------------

**කර්මාන්ත ගිණුම**

--------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2017 ජූලි 18 දින තැන්පත් කළ නමුත් උපලබ්ධි නොවූ රු.96,265 ක චෙක්පතට අදාළ මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අයකර ගැනීමට කටයුතු කළයුතු වේ. | ඉදිරියේ දී නිවැරදි කරමි. |

## 2.3 ආදායම් පරිපාලනය

### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 4,071,700 | 3,755,197 | 3,097,984 | 7,977,027 | 3,814,100 | 3,673,913 | 3,271,780 | 7,319,814 |
| කුලී | 26,840,000 | 20,886,239 | 7,935,649 | 24,204,627 | 2,973,677 | 1,243,410 | 1,285,000 | 11,254,027 |
| බලපත්‍ර ගාස්තු | 7,824,850 | 432,850 | 431,650 | 52,200 | 5,073,250 | 382,500 | 363,100 | 51,000 |
| වෙනත් ආදායම් | 154,325,450 | 110,718,990 | 18,217,230 | 121,026,958 | 97,411,950 | 19,476,941 | 14,200,000 | 28,525,198 |
| | 193,062,000 | 135,793,276 | 29,682,503 | 153,260,812 | 109,272,977 | 24,776,764 | 19,119,880 | 47,150,039 |

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුළ අයවිය යුතු මුළු ආදායම රු.182,943,315 ක් වුවද, රැස්කල ආදායම රු.29,682,503 ක් වීමෙන් ආදායම් රැස්කිරීමේ ප්‍රතිශතය සියයට 16 ක්ව පැවැතුණි. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත වේ. | ඉදිරියේ දී හිඟ ආදායම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කරමි. |

### 2.3.3 වරිපනම් හා බදු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | 2 |
|---|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුළ අයවිය යුතු වරිපනම් හා බදු ආදායම රු.11,075,011 ක් වුවද, රැස්කල ආදායම රු.3,097,984 ක් වීමෙන් වරිපනම් හා බදු ආදායම් රැස්කිරීමේ ප්‍රගතිය සියයට 28 ක තරම් අඩු මට්ටමක පැවතුණි. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගතයුතු වේ. | ඉදිරියේ දී හිඟ ආදායම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කරමි. | |

.3.4 බදු කුලී

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය තුළ අයකරගත යුතු ආදායම රු.32,140,266 ක් වූ අතර, රැස්කල ආදායම රු.7,935,640 ක් වීමෙන් ආදායම් අයවීම සියයට 25 ක් තරම් අඩු අගයක් ගෙන තිබුණි. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතු වේ. | ඉදිරියේ දී හිඟ ආදායම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කරමි. |

2.3.5 වෙනත් ආදායම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය තුළ අයවිය යුතු රු.139,244,188 ක් වූ මුළු ආදායමින් වර්ෂයේ අයකිරීම් රු.18,217,229 ක් වීමෙන් අයකිරීම් ප්‍රතිශතය සියයට 13 ක් විය. මේ අනුව වෙනත් ආදායම් අය කිරීමේ දූර්වල තත්ත්වයක් පැවැතුණි. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතු වේ. | හිඟ ආදායම් අයකර ගනිමි. |

2.3.6 උසාවි දඩ හා මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට උසාවි දඩ වෙනුවෙන් රු.1,262,000 ක් හා මුද්දර ගාස්තු වෙනුවෙන් රු.109,456,990 ක් ලැබිය යුතුව තිබුණි. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතු වේ. | ප්‍රධාන ලේකම්ගෙන් හිඟ මුදල් ලබා ගැනීමට ලිපි යවා ඇත. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම ජනතාවගේ සුඛ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳ අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

**(අ) ක්‍රියාකාරී සැලැස්ම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභාව විසින් ඉටුකල යුතුව තිබුණු කර්තව්‍යයන් වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ දී වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කළ යුතු වේ. | ඉදිරියේ දී වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීමට කටයුතු කරමි. |

**(ආ) ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභා බලප්‍රදේශයෙන් එකතු වන කසළ වලින් කාබනික පොහොර සෑදීම සහ ප්‍රතිචක්‍රීයකරණය සඳහා යොදවා ආදායම් උපයා ගැනීමට කටයුතු කර නොතිබූ අතර, ඉඩමකට බැහැර කරන ලද කසළ පස් දමා වැසීම වෙනුවෙන් 2018 වර්ෂයේ ඔක්තෝබර් මස වනවිට සභා අරමුදලින් රු.1,181,780 ක් ගෙවා තිබුණි. සභාව විසින් කසළ බැහැර කිරීම සඳහා පරිසර බලපත්‍රය ද ලබාගෙන නොතිබුණි. | කසළ බැහැර කිරීම සඳහා විධිමත් හා දීර්සකාලීන වැඩපිළිවෙලක්පිළියෙල කළයුතු වේ. | රජයේ ඉඩමක් ලබා ගැනීම සඳහා කටයුතු කරන අතර, දීර්සකාලීන වැඩපිළිවෙලක් සකස් කරමි. |

**(ඇ) තිරසර සංවර්ධන ඉලක්ක**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| තිරසර සංවර්ධනය සඳහා වන 2030 න්‍යාය පත්‍රයේ, තිරසර සංවර්ධන අරමුණු සහ ඉලක්ක සඳහා වන ගෝලීය දර්ශක තුලින් සභා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නැංවීම සඳහා වන දිගුකාලීන සැලසුම් සභාව විසින් සකස් කර නොතිබුණි. | දීර්සකාලීන සැලසුම් සකස් කර ජනතාවගේ ජීවන තත්ත්වය ඉහල නැංවිය යුතු වේ. | බල ප්‍රදේශයේ ජනතාවගේ ජීවන තත්ත්වය ඉහල නැංවීමට ඉදිරියේ දී සැලැස්මක් සකස් කරමි. |

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **ආදායම් අයකර නොගැනීම**<br>සභාවට අයත් අහංගම පොදු වෙළඳ සංකීර්ණයේ කඩ කාමර 78 ක් බදු දී තිබුණු අතර, එම බදුකරුවන්ගෙන් එක්වර අයකර ගතයුතු එක්වන් මුදල රු.22,914,800 ක් 2018 දෙසැම්බර් 31 දින වනවිටත් අය කරගෙන නොතිබුණි. | හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කළයුතු වේ. | විෂයභාර අමාත්‍යවරයාගේ නිසි අනුමැතිය ලබාගෙන හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කරමි. |

**3.3 මානව සම්පත් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සේවක සංඛ්‍යා සැලැස්මේ අනුමත තනතුරු 22 ක පැවති පුරප්පාඩු සම්පූර්ණ කර නොතිබුණි. | පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | දැනටමත් අයදුම්පත් කැඳවා බඳවා ගැනීම් කටයුතු සිදු කරමි. |
| (ආ) | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 25/2014 ට අනුකූල නොවන පරිදි බඳවාගත් ආදේශක සේවකයින් 09 දෙනෙකුට වැටුප් හා දීමනා ගෙවීම සඳහා 2018 වර්ෂය තුළදී රු.2,963,118 ක් වැයකර තිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | මු.රෙ. 71 යටතේ ඉදිරියේ දී විධිමත් කිරීමට කටයුතු කරමි. |
| (ඇ) | සභාවේ කම්කරු හා කාර්යාල කාර්ය සහායකයින් 10 දෙනෙකු තමුන්ගේ නිත්‍ය රාජකාරි තනතුරට අයත් නොවන කළමනාකරණ සහකාර සේවයේ රාජකාරි සඳහා යොදවා තිබුණි. | නිත්‍ය රාජකාරිය පැවරිය යුතු වේ. | කාර්ය මණ්ඩලය අඩුකම නිසා පරිපාලන පහසුව සඳහා තාවකාලික වැඩපිළිවෙලක් ලෙස යොදා ඇත. ඉදිරියේදී නිවැරදි කරමි. |

**3.4 සේවක ණය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභාවේ සේවය කර ස්ථාන මාරු වී ගිය, විශ්‍රාම ගිය හා සේවය හැර ගිය සේවකයින් 19 දෙනෙකුගෙන් 2009 වර්ෂයේ සිට අයවිය යුතු සේවක ණය රු.1,286,082 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කළයුතු වේ. | දැනටමත් අයකර ගැනීමට කටයුතු කරමි. |

**3.5 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

**3.5.1 නිෂ්ක්‍රීය හා ඌණ උපයෝජිත වත්කම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2015 ජූලි 10 දිනැති අංක 02/2015 දරන භාණ්ඩාගාර චක්‍රලේඛයේ දැක්වෙන විධිවිධාන ප්‍රකාරව සභාවට අයත් වාහන 10 ක් 2004 වර්ෂයේ සිට අපහරණය කිරීමට හෝ අළුත්වැඩියා කිරීමට කටයුතු කිරීමෙන් තොරව, විවිධ ස්ථානවල නවතා තිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළයුතු වේ. | පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් තක්සේරු වාර්තා ලබාගෙන නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**4. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය**

**4.1 අයවැය පාලනය**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | වියදම් විෂයයන් 06 ක රු.76,259,251 ක් වූ ප්‍රතිපාදන ඉතිරිවීම් තිබූ අතර, එය සියයට 32 ත්, 94 ත් දක්වා පරාසයක විය. | තාත්වික ඇස්තමේන්තු පිළියෙල කළයුතු වේ. | ඉදිරි වර්ෂයේ දී මේ සම්බන්ධයෙන් ඉලක්ක වියදම් ළඟාකර ගැනීමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| (ආ) | වියදම් විෂයයක අහිතකර විචලනය රු.7,923,012 ක් හෙවත් සියයට 114 ක් විය. | තාත්වික ඇස්තමේන්තු පිළියෙල කළයුතු වේ. | ඉදිරි වර්ෂයේ දී මේ සම්බන්ධයෙන් ඉලක්ක වියදම් ළඟාකර ගැනීමට කටයුතු කරමි. |

**4.2** **විගණන හා කළමනාකරණ කමිටු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2009 ජුනි 09 දිනැති අංක DMA/2009(i) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවීමට සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් කටයුතු කර නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළයුතු වේ | ඉදිරියේ දී නියමිත පරිදි කමිටු පැවැත්වීමට පියවර ගනිමි. |